2015.08.12

# මැතිවරණයට රාජ්‍ය මුදල් අවභාවිත කළ අයට එරෙහිව පැෆරල් අල්ලස් කොමිසමට යයි

**ඉන්දික හේවාවිතාරණ**

මැතිවරණය වෙනුවෙන් රාජ්‍ය මුදල් අවභාවිතයට ලක්කළ පුද්ගලයන්ට එරෙහිව සහ රාජ්‍ය පත්වීම ලබාදුන් පුද්ගලයන්ට එරෙහිව මැතිවරණ අවසන් වූ වහාම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට හා මානව හිමිකම් කොමිසමට පැමිණිලි කරන බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

රාජ්‍ය මුදල් පිළිබඳව හා පත්වීම් ලබාදීම පිළිබඳව පැමිණිලි ගණනාවක් තම සංවිධානයට ලැබී තිබෙන බවත්, ඊට අදාළ සාක්ෂි මේ දිනවල එකතු කරමින් තිබෙන බවත් එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මීට අමතරව ලැබී තිබෙන පැමිණිලිවලට අනුව අධිකරණයට පැමිණිලි කිරීමට හැකි සිද්ධීන් තිබේදැයි සොයා බලමින් සිටින බවත්, එසේ අධිකරණයට ඉදිරිපත් කළ හැකි පැමිණිලි තිබුණහොත් ඒවා අධිකරණයට ඉදිරිපත් කරන බවත් ඔහු පවසා සිටියේය.

දැනට ලැබී තිබෙන පැමිණිලිවලට අදාළව මේ වනවිට සාක්ෂි එකතු කරමින් තිබෙන බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.